### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

### ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

ශ්‍රී ලංකා දුම්රිය සේවය (SLR) වෙනුවෙන්, ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ඉහළ තලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින්, කොළඹ දිස්ත්‍රික්කයේ බස්නාහිර පළාතේ පිහිටි පහත සඳහන් ව්‍යාපෘතිය සඳහා මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ.

| කොන්ත්‍රාත් අංකය | කොන්ත්‍රාත් නාමය | ඉංජිනේරුවරයාගේ ඇස්තමේන්තුව (අනිශ්චිතතා ඇතුළත්ව) - රුපියල් මිලියන - | සීඩා ශ්‍රේණිය හා විශේෂඥතාවය | ලංසු ඇපකරය - රුපියල් මිලියන - | කොන්ත්‍රාත් කාලය - දින - |
|---|---|---|---|---|---|
| SRS/F. 8178 | ප්‍රධාන මාර්ගයේ 3M OCH හි කැලණිය පැරණි දුම්රිය පාලම ප්‍රතිසංස්කරණය කිරීම. | 5,993 | CS2 (පාලම්) + EM1 (බර වාතේ සැකසුම්) | 90 | 910 |

අදාළ කාර්යය සඳහා පැරණි කැලණිය දුම්රිය පාලම ප්‍රතිසංස්කරණ කටයුතු අයත්වේ. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය (NCB) තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීම සඳහා, සාර්ථක ලංසුකරු, දැනට, ඉදිකිරීම් කාර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි (සීඩා) ඉහත වගුවේ දක්වා ඇති ශ්‍රේණියන් හි, පාලම් හා බරවාතේ සැකසුම් විශේෂඥතාවයේ ලියාපදිංචි වී සිටිය යුතුය.

උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, පහත සඳහන් කාර්යාලය වෙතින් ලබාගත හැකි අතර, අදාළ ප්‍රසම්පාදන ලේඛන, 2026-08-19 දින සිට 2026-09-22 දින දක්වා පෙ.ව. 9.00 හා ප.ව. 3.00 අතර කාලය තුළ, සතියේ දිනවල, (නිවාඩු දිනවල හැර) පහත සඳහන් කාර්යාලයේදී පරීක්ෂා කොට බැලිය හැක.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**
**ප්‍රසම්පාදන (උප) දෙපාර්තමේන්තුව,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය, ඕල්කොට් මාවත, කොළඹ 10.**

| | | |
|---|---|---|
| **දුරකථන අංක** | : | **94(11)24 33280 හෝ 94 (11) 4600204** |
| **ෆැක්ස් අංක** | : | **94 (11) 2432044** |
| **ඊමේල්** | : | **srs.slr@gmail.com හෝ tender2@railway.gov.lk** |
| **වෙබ් අඩවිය** | : | **www.railway.gov.lk** |

මේ සම්බන්ධ පෙර - ලංසු රැස්වීම, 2026-09-03 දින පෙ.ව. 10.00 ට කොළඹ 10, ඕල්කොට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) කාර්යාලයේදී පැවැත්වීමට නියමිත අතර, ඉන් පසු වැඩබිම් චාරිකාවක් සංවිධානය කෙරෙනු ඇත.

අදාළ ආපසු නොගෙවනු ලබන ගාස්තු ගෙවා ලබාගත් වලංගු මුදල් තැන්පතු හා සමග ලිඛිත අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන්, 2026-08-19 දින සිට 2026-09-22 දින දක්වා පෙ.ව. 9.00 හා ප.ව. 3.00 අතර කාලය තුළ, උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉහත කොන්ත්‍රාත්තුව සඳහා වන ඉංග්‍රීසි භාෂාවෙන් සකස්කළ සම්පූර්ණ ලංසු ලේඛන් කට්ටලයක් මිලදීගත හැක.

ප්‍රසම්පාදන ලේඛන සඳහා වන අදාළ ආපසු නොගෙවනු ලබන ගාස්තු රුපියල් 500,000.00 මුදල් (වැට් සහිතව) පහත සඳහන් බැංකු ගිණුම් වෙත මුදලින් තැන්පත් කළ යුතුවේ.

**ගිණුමේ නාමය : සාමාන්‍යාධිකාරී - ශ්‍රී ලංකා දුම්රිය සේවය**
**ගිණුම් අංකය : 176100199027357**
**බැංකුවේ නාමය : මහජන බැංකුව, මධ්‍ය නගර ශාඛාව, කොළඹ 10.**

අදාළ තැන්පතු ලදු පත්වල වලංගු මුල් පිටපත් ලංසු ඉදිරිපත් කරනු බන අවස්ථාවේදී ලංසු සමග ඉදිරිපත් කළ යුතු අතර, ඒ සම්බන්ධව පරීක්ෂා කොට බලනු ඇත.

1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත ප්‍රකාරව, ඒජන්තවරු හා සාර්ථක ලංසුකරුවන් පමණක් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරනු ලැබේ.

ලංසු සමග, ඉහත වගුවේ සඳහන් පරිදි වූ ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතු අතර, එම ලංසු ඇපකරය, අදාළ ලංසු වලංගු කාලයෙන් ඉදිරියට දින 28 දක්වා වලංගු විය යුතුය.

ලංසු පිටපත් දෙකක් වශයෙන් සකස් කොට, 2026.09.23 දින ප.ව. 2.00 ට පෙර ලැබෙන සේ සභාපති, ඉහළ තලයේ ප්‍රසම්පාදන කමිටුව, ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය, 7 වන මහල, සෙත්සිරිපාය, අදියර II, බත්තරමුල්ල යන ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

, ලංසු, දැනට නියමිත අදාළ අවසන් දිනයේ සිට දින 189 ක් දක්වා වලංගු විය යුතුය.

**සභාපති,**
**ඉහළ තලයේ ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.**